# අහේතුවාදී චිත්තවේග ඛණ්ඩන න්‍යායාත්මක සූත්‍රයක් වශයෙන් විතක්කසණ්ඨාන සූත්‍රයෙහි භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කොග්ගල්ලේ විජිත හිමි[1]

## හැඳින්වීම

නූතන සමාජය වඩාත් සංකීර්ණ වීමත් සමග මානසික ගැටලු අතිශයින් සුලභ මාතෘකාවක් බවට පත් ව තිබේ. ක්ලමථය, විශාදය, භීතිකා රෝගය, මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය, සියදිවිනසා ගැනීම ඒ අතර සුලභ ව දැකිය හැකි ය. බුදුදහම පෙන්වා දෙන්නේ කායික ව වසරක්, වසර දහයක්, වසර විස්සක්, වසර පනහක්, වසර සියයක් නිරෝගී ව සිටිනවාට වඩා චෛතසික වශයෙන් එක් මොහොතක් හෝ නීරෝගී ව සිටී ම අපහසු බව යි. අහේතුවාදී චිත්තවේග මේ සඳහා ප්‍රධාන රෝග කාරකය  බව පිළිගැනීම යි. බටහිර මනෝවිද්‍යාත්මක උපදේශනය මෙබඳු ගැටලු සහ රෝග නිවාරණය සඳහා බොහෝ මනෝවිද්‍යාත්මක න්‍යායයන් සහ ක්‍රම ශිල්ප රාශියක් සොයාගෙන තිබේ. බුදුදහම සියලු සත්වයාගේ සියලු දුක් නිවාරණය පිළිබඳ ඉගැන් වූ දර්ශනයකි. එහෙයින් මෙබඳු ගැටලු නිරාකරණය සඳහා බෞද්ධ න්‍යායයන් රාශියක් සූත්‍ර දේශනා තුළ අන්තර්ගත වේ. එම ඉගැන්වීම් මානවයාගේ කායික, මානසික, සාමාජික සහ ආධ්‍යාත්මික සෞඛ්‍ය සඳහා නූතන සමාජයට හඳුන්වාදීම අතිශය වැදගත් වේ. එදිනෙදා ප්‍රායෝගික ජීවිතය තුළ ඇතිවන ගැටලු නිරාකරණය සඳහා ප්‍රායෝගික, මනෝවිද්‍යාත්මක විසඳුම් සමාජය අපේක්ෂා කරයි. බුදුදහම මනෝවිද්‍යාත්මක දර්ශනයක් බැවින් වෙනත් කිසිඳු ආගමක, දර්ශනයක, සම්ප්‍රදායක දැකගත නොහැකි ප්‍රායෝගික ව භාවිත කළ හැකි න්‍යායයන් හා ක්‍රම ශිල්ප ත්‍රිපිටකයෙහි විසිරී පැතිරී පවතී. අතීතයටත් වඩා නූතන සංකීර්ණ සමාජයට එහි අවශ්‍යතාව වඩ වඩාත් තීව්‍ර වෙමින් පවතී. එබඳු ඉගැන්වීම් ලෝකයට දායාද කිරීම මානව හා සමාජ යහපැවැත්ම සඳහා මෙන්ම බෞද්ධ දර්ශන විෂයෙහි සංවර්ධනයට මෙන්ම ව්‍යාප්තියට ද සෘජුලෙස බලපායි.

## අරමුණු

බෞද්ධ සූත්‍ර දේශනා අතර මානසිත රෝග සහ මානසික ගැටලු සඳහා මනෝ ප්‍රතිකාර න්‍යායයක් වශයෙන් භාවිත කළ හැකි එක් ප්‍රධාන සූත්‍රයක් වශයෙන් මජ්ඣිම නිකායෙහි එන විතක්ක සන්ඨාන සූත්‍රය හඳුනාගත හැකි ය. එම

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය,
koggalle.wijitha@yahoo.com

සූත්‍රයෙහි අන්තර්ගත න්‍යායාත්මක කරුණු අහේතුවාදී චිත්තවේග බණ්ඩනය සඳහා න්‍යායයන් වශයෙන් භාවිත කළ හැකිදැයි විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අපේක්ෂාව යි.

### පර්යේෂණ ගැටලුව

මානසික ව ඇතිවන අහේතුවාදී චිත්තවේග බණ්ඩනය සඳහා න්‍යායාත්මක සූත්‍රයක් වශයෙන් විතක්ක සන්ඨාන සූත්‍රය භාවිත කළ හැකි ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව යි. මෙහි දී එම සූත්‍රයෙහි අන්තර්ගත ඉගැන්වීම් ආශ්‍රයෙන් ඒ පිළිබඳ විමර්ශන කිරීම සිදුකෙරේ.

### පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය විමර්ශනයක් වශයෙන් සිදුකරන මෙම පර්යේෂණයෙහි ප්‍රධාන මූලාශය වශයෙන් විතක්ක සන්ඨාන සූත්‍රය ද අතිරේක ව අදාළ කරගතහැකි වෙනත් ප්‍රාථමික මූලාශ්‍ර මෙන්ම ද්විතීයික මූලාශ්‍ර ද සඟරා හා ශබ්දකෝෂ ආදිය ද භාවිත කිරීමට අපේක්ෂා කෙරේ.

### පර්යේෂණයෙහි වැදගත්කම

මානසික රෝග මෙන්ම මානසික ගැටලු නූතන ලෝකයෙහි එදිනෙදා සාකච්ඡාවට බඳුන් වන මාතෘකාවක් බවට පත් ව තිබේ. ඒ සඳහා ප්‍රධාන රෝග කාරකයක් ලෙස බටහිර උපදේශන මනෝවිද්‍යාව අහේතුවාදී චිත්තවේග ප්‍රමුඛකොට සලකනු ලැබේ. බටහිර මනෝවිද්‍යාත්මක උපදේශන විෂයෙහි අහේතුවාදී චිත්තවේග බණ්ඩනය සඳහා පිළිගත් න්‍යායන් සහ ක්‍රම ශිල්ප භාවිත වුව ද බුදුදහම තුළ ඒ සඳහා පිළිගත් න්‍යායයක් හෝ ක්‍රම ශිල්පයක් නිශ්චිත වශයෙන් මෙතෙක් හඳුනාගෙන නොමැත. බෞද්ධ සූත්‍ර දේශනා තුළ එබඳු ඉගැන්වීම් රාශියක් අන්තර්ගත වේ. විතක්ක සණ්ඨාන සූත්‍රයෙහි එබඳු න්‍යායයන් පහක් පිළිබඳව සඳහන් වේ. ඒ අනුව මෙමඟින් නව බෞද්ධ මනෝවිද්‍යා උපදේශන න්‍යායයන් පහක් ලෝකයට හඳුන්වාදීමට ද අපේක්ෂා කෙරේ. ඒ අනුව අහේතුවාදී චිත්තවේග හේතුවෙන් ප්‍රභවය වන මානසික රෝග සහ ගැටලු සඳහා එය භාවිත කළ හැකි ය. එය බෞද්ධ උපදේශන විෂය පෝෂණයට, සංවර්ධනයට, එහි ව්‍යාප්තියට පමණක් මානව ගැටලු නිරාකරණය කරමින් මානසික සෞඛ්‍ය යහපත් ව පත්වාගෙන යාමට බෙහෙවින් වැදගත් වේ.

**නිගමනය**

මානසික වශයෙන් ඇතිවන බොහෝ මානසික රෝග සහ ගැටලු සඳහා රෝග කාරකයක් වශයෙන් පිළිගැනෙන අහේතුවාදී චිත්තවේග ඛණ්ඩනය සඳහා බෞද්ධ මනෝවිද්‍යාත්මක උපදේශන න්‍යායාත්මක සූත්‍රයක් වශයෙන් මජ්ඣිම නිකායට අයත් විතක්ක සණ්ඨාන සූත්‍රය භාවිත කළ හැකි බව සකාරණ ව නිගමනය කිරීම මෙහි දී සිදුකිරීමට නියමිත ය.

ප්‍රමුඛ පදඃ අඤ්ඤනිමිත්තපබ්බ, ආදීනවපබ්බ, අසතිපබ්බ, විතක්කමූලභෙදපබ්බ, අභිනිග්ගණ්හනපබ්බ

**ආශ්‍රිත ග්‍රන්ථ**

*මජ්ඣිම නිකාය* (2006). බු.ජ.මු. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ගල්මංගොඩ, සුමනපාල. (2003). *ආයුර්වේද අධ්‍යයනය.* ගම්පහ වික්‍රමරච්චි ආයුර්වේද ආයතනය.

විජිත හිමි, කොග්ගල්ලේ. (2008). *බෞද්ධ සහ බටහිර මනෝචිකිත්සාව.* මරදානඃ සූරිය ප්‍රකාශකයෝ.

එදිරිසිංහ, දයා, පෙරේරා, ඥානදාස. (2001). *දාර්ශනික විමර්ශන*, දෙහිවලඃ වත්මා ප්‍රකාශකයෝ.

නිශ්ශංක, එච්.එස්.එස්. (2001). *බෞද්ධ මනෝ චිකිත්සාව.* කොළඹඃ ගුණසේන සමාගම.

Adler, Alfred (1927/1994). *Understanding Human Nature*. Oxford( One World.

Chertok, Leon. (1981). *Sense and Nonsense in Psychotherapy*. Oxford Pergamon Press.